**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**
பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழு
**UNIVERSITY GRANTS COMMISSION**

## <u>2019 අගෝස්තු මාසයේ දී පැරණි හා නව විෂය නිර්දේශ යටතේ පැවැත්වූ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුගමනය කළ ක්‍රමවේදය</u>

රජයේ ජාතික ප්‍රතිපත්තියට අනුව අ.පො.ස (උසස් පෙළ) විභාගයෙහි විෂය නිර්දේශය වසර අටකට වරක් සංශෝධනය කෙරේ.

### 1. <u>පසුබිම</u>

ඒ අනුව, 2011 වර්ෂයේ අගෝස්තු මාසයේ දී පැවැත්වූ අ.පො.ස. (උසස් පෙළ) විභාගය නව හා පැරණි විෂය නිර්දේශ යටතේ විභාග දෙකක් ලෙස පැවැත්විණ.

පිළිගත් සංඛ්‍යානමය ක්‍රමවේදයක් භාවිතා කරමින් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඇති ස්ථාන ගණන 2011 වසරේ නව හා පැරණි නිර්දේශ යටතේ අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිට විශ්වවිද්‍යාල සඳහා අයදුම් කරනු ලැබූ සිසුන් කාණ්ඩ දෙකින්ම පිරවිය යුතු බැවින්, 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය තීරණය කිරීමට අවශ්‍ය නිර්දේශ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිපුණතා කමිටුවක් පත් කරන ලදී.

එම නිපුණතා කමිටුව විසින් පැරණි හා නව විෂය නිර්දේශ යටතේ විභාගයට පෙනී සිටි සිසුන් තනි කණ්ඩායමක් ලෙස සලකමින් සිසුන් ශ්‍රේණිගත කිරීමට සහ අදාළ Z- අගයන් ගණනය කිරීම සඳහා සංචිත Z- අගය (Pooled Z-core) ක්‍රමයක් නිර්දේශ කළ අතර ඊට අනුකූලව විභාග දෙපාර්තමේන්තුව විසින් එම වසරේ අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල නිකුත් කරන ලදි.

### අ. <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුගමනය කළ ක්‍රමවේදය උසාවිය ඉදිරියේ අභියෝගයට ලක් කිරීම</u>

කෙසේ වෙතත්, **කුසලතා අනුපිළිවෙල අනුව සිසුන්ව ශ්‍රේණිගත කිරීම සඳහා, 2011 වර්ෂයේ දී පැවැත්වූ අ.පො.ස (උසස් පෙළ) විභාගයට පැරණි හා නව විෂය නිර්දේශ යටතේ පෙනී සිටි සිසුන් කණ්ඩායම් දෙක ඒකාබද්ධ කිරීමට ගත් තීරණය අභියෝගයට ලක් කරමින්**, ලංකා ගුරු සංගමය සහ 2011 වර්ෂයේ දී අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන් 16 දෙනෙකු විසින් විභාග දෙපාර්තමේන්තුවට, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සහ තවත් කිහිප දෙනෙකුට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩුවක් ගොනු කරන ලදී. [ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 29/2012].

ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණය සිය තීන්දුව 2012.06.25 දින ප්‍රකාශයට පත් කරමින් දෙවන වග උත්තරකරු වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ (වරින් වර සංශෝධිත) 15 (vii) වගන්තියට අනුකූලව කටයුතු කිරීමටත්, පැරණි හා නව විෂය නිර්දේශයන් දෙක වෙනම කාණ්ඩ දෙකක් වශයෙන් සලකමින් පිළිගත් සංඛ්‍යානමය සම්මතයන් හා මූලධර්මයන්ට අනුකූලව 2011 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින්ගේ Z- අගයන් නැවත නිකුත් කිරීම සඳහා අවශ්‍ය හා අදාළ පියවර ගැනීමටත් නියෝග කරන ලදි.

එම තීන්දුව ලබා දුන් විගසම, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවට අනුකූලව Z- අගයන් ගණනය කිරීමට සහ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීම පිණිස පැරණි සහ නව විෂය නිර්දේශවලට අයත් ශිෂ්‍ය කණ්ඩායම් දෙකෙහිම සිසුන් ශ්‍රේණිගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් යෝජනා කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් නව නිපුණතා කමිටුවක් පත් කරන ලදි.

ඒ අනුව කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී:

- අ.පො.ස (උසස් පෙළ) විභාගයට පැරණි හා නව විෂය නිර්දේශ යටතේ පෙනී සිටි සිසුන් වෙනම කාණ්ඩ දෙකක් ලෙස සලකමින් Z- අගයන් ගණනය කිරීම.
- එම කණ්ඩායම් දෙකෙහි Z - ලකුණු ඒකාබද්ධ කර අවරෝහණ පිළිවෙලට සකස් කිරීමෙන් 2011 වර්ෂයේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ Z- අගයන් නිකුත් කිරීම.

ඒ අනුව, විභාග දෙපාර්තමේතුව විසින් අ.පො.ස (උසස් පෙළ) විභාගයේ Z- අගයන් නැවත නිකුත් කරන ලදි.

පසුව, නව Z- අගයන් නිකුත් කිරීමත් සමඟම තමන්ගේ ශ්‍රේණි පහත වැටුණු තවත් සිසුන් පිරිසක් මෙම ක්‍රමවේදය අභියෝගයට ලක් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නඩු කිහිපයක් ගොනු කළහ. [ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 418/2012, 441/2012, 445/2012, 462/2012, 459/2012 සහ 460/2012]

**ආ. <u>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් යෝජනා කරන ලද විකල්පය</u>**

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සියලු පාර්ශවයන්ගෙන් කරුණු විමසීමෙන් අනතුරුව, පසුව නිකුත් කරන ලද ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව පැරණි හා නව විෂය නිර්දේශයන් වෙනම කාණ්ඩ දෙකක් ලෙස සලකා සිසුන් තෝරා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයක් යෝජනා කරන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නියම කරන ලදි.

**සිසුන් විභාගයට පෙනී සිටි වාර ගණන අනුව (එනම් පළමු වර විභාගයට පෙනී සිටින්නන් සහ දෙවන සහ තුන්වන වර විභාගයට පෙනී සිටින්නන් වෙනම කාණ්ඩ දෙකක් හැටියට සලකා) සහ එක් එක් අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනුනු අතීත රටාවන් සලකා බලා සුදුසු ක්‍රමවේදයක් සකසා ගැනීම එකම සාධාරණ විසඳුම** බවට සියලු පාර්ශ්වයන් එකඟ විය.

ඊට අනුකූලව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විකල්ප හතරක් යෝජනා කරමින් වාර්තාවක් සකස් කරන ලදි. එම විකල්ප හතර අතුරින්, **දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සහ දිස්ත්‍රික් කුසලතා පදනම මත එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද පළමු වරට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගේ සහ දෙවන සහ තුන්වැනි වරට අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගේ ප්‍රතිශත වෙන වෙනම ගණනය කර, පසුගිය වසර පහක් ඇතුලත වූ උපරිම අගය (maximum ratio) අනුව සිසුන් තෝරා ගැනීම භාවිත කරමින්**

**සකස් කරන ලද තුන්වන විකල්පය** මෙම ගැටලුවට ඇති වඩාත්ම සාධාරණ විසඳුම ලෙස සියලු පාර්ශවයන් විසින් එකඟ වූහ.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලැයිස්තු දෙකම යටතේ (එනම් ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 29/2012 ට පෙර නිකුත් කරන ලද පළමු ලැයිස්තුව සහ නඩුවෙන් පසුව නිකුත් කරන ලද ලැයිස්තුව) වැඩි සිසුන් පිරිසක් විශ්වවිද්‍යාලවලට තෝරා ගන්නා ලෙස අධිකරණය සිදු කළ ඉල්ලීම හේතුවෙන්, සාමාන්‍ය ප්‍රවේශය යටතේ බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාවට වඩා අමතර සිසුන් සංඛ්‍යාවක් විශ්වවිද්‍යාල වලට බඳවා ගැනීමටත්, විශ්වවිද්‍යාලවලට අමතර මූල්‍යාධාර සැපයීමටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිදු විය.

එකී, නඩු තීන්දුවට අනුව උපරිම අගය භාවිතා කරමින් සිසුන් තෝරාගැනීම 2011/2012 අධ්‍යයන වර්ෂයට පමණක් අදාල වන බව, එම නියෝගයේ සඳහන් කර ඇත.

## 2. <u>2019 වර්ෂයේ දී අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පැරණි හා නව විෂය නිර්දේශ යටතේ පෙනී සිටි අපේක්ෂකයින් විශ්වවිද්‍යාල වෙත තෝරා ගැනීම</u>

2019 වර්ෂයේ දී ද නව හා පැරණි විෂය නිර්දේශ යටතේ අ.පො.ස (උසස් පෙළ) විභාග දෙකක් පැවැත්වීමට නියමිත බව විභාග දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වන ලදි.

මෙවර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 29/2012 මඟින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නියෝගය එනම් අ.පො.ස (උසස් පෙළ) පැරණි හා නව විෂය නිර්දේශයන් යටතේ පෙනී සිටින සිසුන් වෙන වෙනම කාණ්ඩ දෙකක් ලෙස සැලකීමේ අවශ්‍යතාවත්, තෝරා ගැනීමේ නිර්ණායක පිළිබඳව සිසුන් පූර්ව දැනුවත් කිරීමේ අවශ්‍යතාවත් සැලකිල්ලට ගෙන, 2019 වර්ෂයේ දී පැවැත්වීමට නියමිත විභාග දෙක පදනම් කරගෙන විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගන්නේ කෙසේද යන්න පිළිබඳව විශේෂඥ අදහස් හා නිර්දේශ ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සහ ඉන් පිටත සිටින සංඛ්‍යාලේඛනඥයින් සහ ගණිතඥයින්ගෙන් සමන්විත නිපුණතා කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදි.

ඒ අනුව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල ප්‍රවේශ කමිටුව සමඟ සාකච්ඡා කර නිපුණතා කමිටුවේ පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී;

- නව විෂය නිර්දේශය සහ පැරණි විෂය නිර්දේශය යටතේ පෙනී සිටින අපේක්ෂකයින් වෙනම කාණ්ඩ දෙකක් ලෙස සැලකීම.
- එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම Z- අගයන් ගණනය කිරීම.
- එක් එක් කාණ්ඩයේ Z- අගයන් මත පදනම්ව ශිෂ්‍ය කාණ්ඩ දෙක සඳහා වෙන වෙනම ශ්‍රේණි කාණ්ඩ දෙකක් තීරණය කිරීම.
- 2013 සිට 2017 දක්වා වන පස් අවුරුදු කාල සීමාව තුළ සිසුන් තෝරා ගැනුණු අතීත රටාවට අනුකූලව සැකසුන 'පස් අවුරුදු සංයුත මධ්‍යකය' යොදාගෙන විෂය නිර්දේශ දෙකක් යටතේ විශ්වවිද්‍යාල සඳහා සිසුන් තෝරා ගැනීම.

ඉන්පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා පැරණි හා නව විෂය නිර්දේශ සිසුන් විශ්වවිද්‍යාල සඳහා තෝරා ගැනීමට අදාළ ක්‍රමවේදය දැක්වෙන පුවත්පත් නිවේදනය 2019 අප්‍රේල් මස 08 වෙනිදා ඩේලි නිවුස්, දිනමිණ, ලංකාදීප, තිනකරන් සහ තිනක්කුරල් යන

සතියේ දින පුවත්පත්හි සහ 2019 මැයි මස 12 වෙනිදා සන්ඩේ ඔබ්සර්වර්, සන්ඩේ ටයිම්ස්, සිළුමිණ, ලංකාදීප, තිනක්කුරල් සහ වාරමන්ජරි යන සති අන්ත පුවත්පත්හි පහත කරුණු විශේෂයෙන් සඳහන් කරමින් පළ කරන ලදී.

- 2019 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා <u>නව නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>පළමු වරට</u> අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ*(Composite Average)* ප්‍රතිශතය වේ.
- 2019 වර්ෂයේ අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා <u>පැරණි නිර්දේශය</u> යටතේ පෙනී සිටින සිසුන් විශ්වවිද්‍යාලවල එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත තෝරා ගනු ලබන ප්‍රතිශතය, 2013 වසරේ සිට 2017 වසර දක්වා වූ පස් අවුරුදු කාලය තුළ දී <u>දෙවන සහ තුන්වන වරට</u> අ.පො.ස.(උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි, පිළිවෙළින් දිස්ත්‍රික් කුසලතා පදනම මත සෑම දිස්ත්‍රික්කයකින්ම සහ දීප ව්‍යාප්ත කුසලතා පදනම මත එම එක් එක් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරන ලද සිසුන්ගේ සංයුත මධ්‍යකයේ*(Composite Average)* ප්‍රතිශතය වේ.

මෙම සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය දැක්වෙන නිවේදනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහිද මහජනයාගේ අවධානය පිණිස පළ කරන ලදී.

මීට අමතරව, 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව 2020 මාර්තු මාසයේදී පළ කරන ලද 'ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය' යන අත්පොතෙහිද විශ්වවිද්‍යාල සඳහා ඇතුල්වීමට බලාපොරොත්තුවෙන් සිටින අපේක්ෂකයන්ගේ දැනගැනීම පිණිස මෙම සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සඳහන් කරන ලදී.

භාෂා තුනෙන්ම 2019 අප්‍රේල් සහ මැයි මාසයන්හි පුවත්පත්වල, 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළව 2020 මාර්තු මාසයේදී පළ කරන ලද විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලද සිසුන් තෝරා ගැනීමේ මෙම ක්‍රමවේදය, එම අවස්ථාවන්හිදී කිසිවෙකු අභියෝගයට ලක් නොකළ බව මෙහිදී සඳහන් කිරීම වැදගත්ය.

**අ. <u>නව විෂය නිර්දේශයේ සහ පැරණි විෂය නිර්දේශයේ Z-අගයන් එකිනෙක සංසංදනය කිරීම</u>**

**නව විෂය නිර්දේශය සහ පැරණි විෂය නිර්දේශය වෙනම කාණ්ඩ දෙකක් වශයෙන් සලකනු ලැබූ බැවින්, නව විෂය නිර්දේශ සිසුන්ගේ සහ පැරණි විෂය නිර්දේශ සිසුන්ගේ Z- අගයන් සහ දීප ව්‍යාප්ත හා දිස්ත්‍රික් ශ්‍රේණි එකිනෙක හා සැසඳිය නොහැකි බව මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වේ.**

**ආ. <u>දීප ව්‍යාප්ත කුසළතා පදනම සහ දිස්ත්‍රික් කුසළතා පදනම</u>**

ජාතික ප්‍රවේශ ප්‍රතිපත්තියට අනුව, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා සිසුන් ඇතුළත් කරගැනීම දීප ව්‍යාප්ත කුසළතා පදනම මත සහ දිස්ත්‍රික් කුසළතා පදනම මත සිදු කරන ලදී. ඒ අනුව, සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලාව, දෘශ්‍ය කලා, දෘශ්‍ය හා තාක්ෂණික කලා සහ චිත්‍ර හා නිර්මාණ යන කලා විෂය ධාරාවේ පාඨමාලවන් හැරුණු විට අනෙකුත් සියලුම කලා විෂය ධාරාවේ පාඨමාලවන් සඳහා සිසුන් තෝරා ගැනීම

සම්පූර්ණයෙන්ම දීප ව්‍යාප්ත කුසලතා පදනම මත සිදු කෙරේ. නමුත්, ඉහත සඳහන් පාඨමාලා හයට සහ අනෙකුත් විෂය ධාරාවන්හි පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීම ද්විත්ව පදනමක් මත දීප ව්‍යාප්ත කුසලතා පදනම සහ දිස්ත්‍රික් පංගු ක්‍රමය අනුව සිදු කෙරේ. එනම්, කිසියම් පාඨමාලාවක පවතින මුළු පංගු ප්‍රමාණයෙන් 40% ක් දක්වා දීප ව්‍යාප්ත කුසලතා පදනම මත පෙළ ගැසූ Z- ලකුණු අනුව ද, ඉතිරි 60% න් 55% ක් දක්වා පරිපාලන දිස්ත්‍රික්ක 25 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව, එනම් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ඒ ඒ දිස්ත්‍රික්කයෙහි ජන සංඛ්‍යා අනුපාතය අනුව ද, ඉතිරි 5%, අධ්‍යාපන පහසුකම් අතින් දුෂ්කර යැයි හඳුනාගෙන ඇති දිස්ත්‍රික්ක 16 අතර එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනයට සමානුපාතිකව, එනම් දිස්ත්‍රික්ක 16 හි මුළු ජනගහනයට ඒ ඒ දිස්ත්‍රික්කයෙහි ජන සංඛ්‍යා අනුපාතය අනුව ද බෙදා හැරේ.

**එබැවින්, මෙම දිස්ත්‍රික් පංගු ක්‍රමය යටතේ ඉහළ Z-අගයක් ලැබූ එක් දිස්ත්‍රික්කයක සිසුවෙක් තම දිස්ත්‍රිකයට අදාළ පංගු ප්‍රමාණය ඇතුළත ඔහු නොසිටීම හේතුවෙන් කිසියම් පාඨමාලාවක් සඳහා තේරී පත් නොවීමටත් එම සිසුවාට වඩා පහළ Z-අගයක් ලැබූ වෙනත් දිස්ත්‍රික්කයක සිසුවෙක් එම පාඨමාලාවට තේරී පත්වීමටත් ඉඩ ඇත.**

ඒ අනුව, **2019/2020** අධ්‍යයන වර්ෂයේ වෛද්‍ය විද්‍යා පාඨමාලාව සඳහා සිසුන් තෝරාගැනීමට භාවිතා කරන ලද සංයුත මධ්‍යයකයන් (composite average) සහ, එම පාඨමාලාව සඳහා සාමාන්‍ය ප්‍රවේශය යටතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් තේරී පත් වූ සිසුන් සංඛ්‍යාව, නව හා පැරණි නිර්දේශය අනුව වෙන වෙනම පහත දක්වා ඇත.

**විශ්වවිද්‍යාලය ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2019/2020**

**දීප ව්‍යාප්ත කුසලතා පදනම සහ දිස්ත්‍රික් කුසලතා පදනම සඳහා සංයුත මධ්‍යයකයේ (Composite Average) ප්‍රතිශතයන්**

**වෛද්‍ය විද්‍යාව පාඨමාලාව**

| | සංයුත මධ්‍යයකයේ ප්‍රතිශතය | |
|---|---|---|
| | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| දීප ව්‍යාප්ත කුසලතා පදනම | 43% | 57% |
| දිස්ත්‍රික් කුසලතා පදනම | නව නිර්දේශය | පැරණි නිර්දේශය |
| 1. කොළඹ | 36% | 64% |
| 2. ගම්පහ | 26% | 74% |
| 3. කළුතර | 14% | 86% |
| 4. මාතලේ | 16% | 84% |
| 5. මහනුවර | 34% | 66% |
| 6. නුවරඑළිය | 35% | 65% |
| 7. ගාල්ල | 27% | 73% |
| 8. මාතර | 18% | 82% |
| 9. හම්බන්තොට | 14% | 86% |

| | | |
|---|---|---|
| 10. යාපනය | 42% | 58% |
| 11. කිලිනොච්චි | 56% | 44% |
| 12. මන්නාරම | 36% | 64% |
| 13. මුලතිව් | 50% | 50% |
| 14. වව්නියා | 54% | 46% |
| 15. ත්‍රිකුණාමලය | 50% | 50% |
| 16. මඩකලපුව | 44% | 56% |
| 17. අම්පාර | 39% | 61% |
| 18. පුත්තලම | 20% | 80% |
| 19. කුරුණෑගල | 22% | 78% |
| 20. අනුරාධපුරය | 25% | 75% |
| 21. පොලොන්නරුව | 17% | 83% |
| 22. බදුල්ල | 27% | 73% |
| 23. මොනරාගල | 17% | 83% |
| 24. කෑගල්ල | 15% | 85% |
| 25. රත්නපුර | 17% | 83% |

**විශ්වවිද්‍යාලය ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2019/2020**

**සාමාන්‍ය ප්‍රවේශය යටතේ නව සහ පැරණි නිර්දේශ යටතේ වෛද්‍ය විද්‍යාව පාඨමාලාව සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | තෝරා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | දීප ව්‍යාප්ත කුසලතා පදනම මත | | දිස්ත්‍රික් කුසලතා පදනම මත | | එකතුව |
| | නව නිර්දේශය | පැරණි නිර්දේශය | නව නිර්දේශය | පැරණි නිර්දේශය | |
| 1. කොළඹ | 93 | 93 | 40 | 72 | 298 |
| 2. ගම්පහ | 20 | 41 | 29 | 82 | 172 |
| 3. කළුතර | 9 | 28 | 8 | 51 | 96 |
| 4. මාතලේ | 4 | 6 | 4 | 20 | 34 |
| 5. මහනුවර | 27 | 31 | 23 | 45 | 126 |
| 6. නුවරඑළිය | 4 | 4 | 15 | 28 | 51 |
| 7. ගාල්ල | 33 | 35 | 14 | 38 | 120 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8. මාතර | 17 | 21 | 7 | 33 | 78 |
| 9. හම්බන්තොට | 7 | 13 | 5 | 32 | 57 |
| 10. යාපනය | 30 | 37 | 15 | 20 | 102 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 4 | 3 | 7 |
| 12. මන්නාරම | 0 | 0 | 2 | 4 | 6 |
| 13. මුලතිව් | 0 | 0 | 3 | 3 | 6 |
| 14. වව්නියා | 4 | 4 | 6 | 5 | 19 |
| 15. ත්‍රිකුණාමලය | 3 | 3 | 12 | 12 | 30 |
| 16. මඩකලපුව | 5 | 2 | 14 | 18 | 39 |
| 17. අම්පාර | 5 | 4 | 16 | 25 | 50 |
| 18. පුත්තලම | 6 | 13 | 9 | 38 | 66 |
| 19. කුරුණෑගල | 18 | 27 | 17 | 62 | 124 |
| 20. අනුරාධපුරය | 2 | 4 | 13 | 39 | 58 |
| 21. පොලොන්නරුව | 3 | 3 | 4 | 21 | 31 |
| 22. බදුල්ල | 5 | 4 | 13 | 36 | 58 |
| 23. මොනරාගල | 1 | 0 | 5 | 23 | 29 |
| 24. කෑගල්ල | 2 | 16 | 6 | 35 | 59 |
| 25. රත්නපුර | 15 | 27 | 11 | 55 | 108 |
| **එකතුව** | **313** | **416** | **295** | **800** | **1824** |

**ඇ. <u>නව විෂය නිර්දේශයේ ජීව විද්‍යා සිසුන් විසින් නඩුවක් ගොනු කිරීම</u>**

මේ අතර, පැරණි විෂය නිර්දේශයේ සිසුන් හා සසඳන විට විභාගයට සූදානම් වීමට තමන්ට තිබූ අවස්ථාව අවම වීම, එහි ප්‍රතිඵලයක් ලෙස එවකට අධ්‍යාපන අමාත්‍යාංශය (විශේෂයෙන් ජාතික අධ්‍යාපන ආයතනය සහ විභාග දෙපාර්තමේන්තුව) විසින් ඔවුන්ට සාධාරණ ලෙස සලකනු නොලැබීම අභියෝගයට ලක් කරමින් සහ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ දී නව විෂය නිර්දේශ ශිෂ්‍ය කණ්ඩායමට වැඩි ස්ථාන ප්‍රමාණයක් වෙන් කළ යුතු ලෙස ඉල්ලමින්, ජීව විද්‍යා විෂය ධාරාවෙන් නව විෂය නිර්දේශය යටතේ 2019 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් කණ්ඩායමක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් නඩු අංක 170/2020 දරණ නඩුවක් ගොනු කළහ. පසුව, පැරණි විෂය නිර්දේශය යටතේ ජීව විද්‍යා විෂය ධාරාවෙන් එම වසරේම අ.පො.ස. (උසස් පෙළ) සඳහා පෙනී සිටි තවත් සිසුන් පිරිසක් මෙම නඩුවට මැදිහත් පෙත්සම්කරුවන් ලෙස ඇතුල් වීම සඳහා ඉල්ලා සිටින ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, එක් එක් අධ්‍යයන පාඨමාලා සඳහා 2013 වසරේ සිට 2017 වසර දක්වා විශ්වවිද්‍යාලවල එක් එක් පාඨමාලාව සඳහා තෝරාගත් සිසුන්ගේ අතීත රටාව අනුගමනය කිරීමෙන්

විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගත හැකි සිසුන් සංඛ්‍යාව හැකිතාක් වැඩි කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගන්නා බවට කොමිෂන් සභාව නියෝජනය කරන රජයේ අධි නීතිඥවරයා මාර්ගයෙන් අධිකරණය වෙත සහතිකයක් ලබා දුන්නේය. තවද, ගරු. නීතිපතිතුමා විසින් පහසුකම් සපයන ලද රැස්වීමක දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් නීතිඥයින්, පෙත්සම්කරුවන්, මැදිහත් පෙත්සම්කරුවන් ඇතුළු කිහිප දෙනෙකු සහ ඔවුන්ගේ දෙමව්පියන් හමුවී 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය ඔවුන් වෙත පැහැදිලි කරන ලදී.

කෙසේ වෙතත්, නිපුණතා කමිටුවේ උපදෙස් මත පදනම්ව 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය කණ්ඩායම් දෙකෙන් අධ්‍යයන පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේදී සංයුක්ත මධ්‍යක ක්‍රමය (Composite average method) භාවිතා කරන බවට පෙර කොමිෂන් සභාව දැනටමත් ප්‍රකාශ කර තිබීම සහ මෙම ක්‍රමයෙන් බැහැරවීම අනවශ්‍ය නීතිමය ගැටළුවලට හේතු විය හැකි බව අවබෝධ කර ගත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කල් තියා ප්‍රකාශ කර ඇති ක්‍රමවේදයට අනුව 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා කඩඉම් ලකුණු නිකුත් කිරීමට තීරණය කරන ලදී.

ඒ බව, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විමසීමට නියමිත නඩුවෙහි පාර්ශවකරුවන්ටද පිටපත් සහිතව මෝසමක් ගොනු කිරීමෙන් ගරු නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දෙන ලදි.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2020 නොවැම්බර් 09